## 01 ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍ර
## 10 ශ්‍රේණිය

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න ඉතිහාස ආචාර්ය ! වසන්ත නතිරනගේ.

01.ඉතිහාසය හැදෑරීමේ සාහිත්‍ය මූලාශ්‍රයක් නොවන්නේ,

1.සන්දේශ කාව්‍යය 2. හටන් කාව්‍ය 3. මිහින්තලා සෙල්ලිපිය 4. බෝධි වංසය

02.ලංකා ඉතිහාසය හැදෑරීමේදී අපට හමුවන පැරණිත ම සාහිත්‍යය මූලාශ්‍රය වන්නේ,

1. මහා වංශය 2. ථූපවංශය 3. දීපවංශය 4. රාජාවලිය

03. ශ්‍රී ලංකාවේ දේශපාලනය පිළිබද තොරතුරු ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

1. පැරකුම්බා සිරිත 2. රාජාවලිය 3. බෝධි වංශය 4. ථූප වංශය

04. ඉතිහාසය ගොඩනැගීමට සාහිත්‍යය මූලාශ්‍ර යොදා ගැනීමේදී සැලකිල්ලට යොමු කළ යුතු කරුණක් නොවන්නේ,

1. මූලාශ්‍රය රචනා වූ කාලය 2. කතුවරයාගේ අරමුණ
3. කතුවරයා භාවිතා කළ උපමා රූපක 4. මූලාශ්‍රයට කරුණු සපයා ගත් ආකාරය

05. ලංකාව පිළිබදව තොරතුරු සදහන් වන දකුණු ඉන්දියානු කෘතියක් වන්නේ,

1. සීලප්පාදිකාරම් 2. සීහලට්ඨකථා 3. වංසත්ථප්පකාසිනි 4. විනයට්ඨකථා

06. වැරදි මූලාශ්‍රය තෝරන්න.

1. චීන මූලාශ්‍රය - පාහියන් හිමිගේ දේශාටන වාර්තා
2. අරාබි මූලාශ්‍රය - ඉබන් බතූතාගේ දේශාටන වාර්තා
3. ඉංග්‍රීසි මූලාශ්‍ර - බැල්ඩියස්ගේ ලංකා පුරාවෘත්තය
4. පෘතුගීසි මූලාශ්‍ර - රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය

07. නාණක විද්‍යාව මගින් හදාරනු ලබන්නේ,

1. කාසි පිළිබදව 2. නටබුන් පිළිබදව 3. සෙල්ලිපි පිළිබදව 4. පැරණි අක්ෂර පිළිබදව

08. ගල්පොත සෙල්ලිපිය කරවූ රජු වනුයේ,

1. කීර්ති ශ්‍රී රාජසිංහ රජු 2. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු 3. මහසෙන් රජු 4. කාවන්තිස්ස රජු

09. පුරාණ නටබුන් වලට අයත් නොවන්නේ,

1. පොකුණු 2. දාගැබ් 3. සෙල්ලිපි 4. වැව්

Scanned by CamScanner

10. අශ්ව හිස හා මිනිසා දැක්වෙන මූර්තිය පිහිටා ඇති විහාරය වන්නේ,

1. සෝමාවති විහාරය 2. මහනුවර දළදා මාලිගය 3. කැලණි විහාරය 4. ඉසුරුමුණි විහාරය

11. අභිලේඛන ලියා ඇති මාධ්‍ය අනුව නිවැරදි වරණය තෝරන්න.

| | |
|---|---|
| 1. සීගිරි ගී | A පනාකඩුව තඹ සන්නස |
| 2. තඹ තහඩුව | B වල්ලිපුරම් සන්නස |
| 3. දැව | C බිත්ති |
| 4. රන් තහඩු | D ඇම්බැක්කේ දේවාල කැටයම් |

1. BCDA 2. ABDC 3. CADB 4. BADC

12. මෙරටින් හමුවන පැරණිතම කාසි හඳුන්වනු ලබනුයේ,

1. කහපණ 2. ලක්ෂ්මි කාසි 3. තඹ මස්ස 4. ස්වස්තික කාසි

13. ගිරිලිපි ලෙස හඳුන්වනු ලබනුයේ,

1. සකස් කර ගත් ගල් පුවරු මත ලියූ ලිපි 2. ගල්ලෙන්වල කටාරම් අසල ලියූ ලිපි
3. ගල් තලාවල හෝ ගල්කුළු මත ලියූ ලිපි 4. සකස් කරගත් ගල් කුළුණු මත ලියූ ලිපි

14. මහා වංශයේ ඇතැම් තැන් අර්ථ විවරණය සඳහා රචිත ටීකාව හඳුන්වනු ලබන්නේ,

1. එළුඅත්තනගලු වංශය 2. බෝධි වංශය 3. සද්ධර්මාලංකාරය 4. වංසත්ථප්පකාසිනි

15. මහා වංශයේ මුල්කොටසේ රචිත හිමිනම වනුයේ,

1. මහානාම හිමි 2. රාහුල හිමි 3. ශ්‍රී සුමංගල හිමි 4. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

(ලකුණු 2x15 = 30)

(01)
1. සංදේශ කාව්‍ය 02 ක් නම් කරන්න.
2. හටන් කාව්‍ය 02 ක් නම් කරන්න.
3. පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර 02ක් නම් කරන්න.
4. ඉතිහාසය හැදින්වීමට ඉවහල්වන දෑ හඳුන්වන්නේ කිනම් නමකින්ද?
5. පනාකඩුව තඹ සන්නස කුමන රජු කෙනෙකු ලියවන ලද්දක්ද?
6. ශ්‍රී ලංකා ඉතිහාසය අඛණ්ඩව ලියවී ඇති කෘතිය කුමක්ද?
7. අභිලේඛන වලට උදාහරණ 2ක් දක්වන්න.
8. ක්ලෝඩියස් ටොලමි අපට වැදගත් වන්නේ කුමන කරුණක් නිසාද?
9. ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම කරුණු දෙකකින් දක්වන්න.
10. සාහිත්‍යය මූලාශ්‍රවල ප්‍රයෝජන 02ක් නම් කරන්න.

(ලකුණු 2x15 = 30)

Scanned by CamScanner